# ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය
# ஸ்ரீ லங்கா நிருவாக சேவைச் சங்கம்
# SRI LANKA ADMINISTRATIVE SERVICE ASSOCIATION

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. — SASA/2023/AGM/1 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. — | දිනය<br>திகதி<br>Date — 2023.06.02 |

**ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ සියලු ම ශාඛා සමිතිවල සභාපතිවරුන්/ලේකම්වරුන්**
**ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ සියලු ම සාමාජිකයින් වෙත,**

**ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ ව්‍යවස්ථාවේ 10.4 වගන්තිය ප්‍රකාර ව නිකුත් කරනු ලබන 40 වැනි සංවත්සරික මහා සභාව පිළිබඳ දැන්වීමයි**

ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ 40 වැනි සංවත්සරික මහා සභාව 2023 ජූනි මස 27 දින පෙ.ව. 10.30ට අංක 275/74, ස්ටැන්ලි විජේසුන්දර මාවත, කොළඹ 07 යන ස්ථානයෙහි පිහිටි බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ දී පැවැත්වෙන බව සංගමයේ සියලු ම සාමාජිකත්වයට දන්වා සිටිනු ලැබේ.

ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ ව්‍යවස්ථාවේ අංක 10.5 වගන්තිය ප්‍රකාර ව සිදු කරනු ලබන යෝජනා සහ ඉදිරි වර්ෂය සඳහා පහත සඳහන් විධායක නිල දැරීම සඳහා සිදු කරනු ලබන නාමයෝජනා වෙතොත් ඒවා ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ ලේකම් වෙත ලිඛිත ව ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දී හෝ ෆැක්ස් මගින් හෝ විද්‍යුත් තැපෑලෙන් 2023 ජූනි මස 19 වන දින ප.ව. 4.00ට පෙර ඉදිරිපත් කළ යුතු ය. එවැනි නාමයෝජනා ලැබීම පිළිබඳ ව නාමයෝජනාව ඉදිරිපත් කරන්නන් වෙත දැනුම් දෙනු ලැබේ.

a. සභාපති
b. උප සභාපති – **තනතුරු පහක් (05)**
c. ලේකම්
d. උප ලේකම්
e. සහකාර ලේකම්
f. භාණ්ඩාගාරික
g. සහකාර භාණ්ඩාගාරි
h. සංස්කාරක
i. සහකාර සංස්කාරක
j. ජාතික සංවිධායක
k. කමිටු සාමාජිකයින් - **තනතුරු නමයක් (09)**

නාමයෝජනා අයදුම්පත්‍රය මේ සමඟ අමුණා ඇති අතර, එය සියලු ම දිස්ත්‍රික් සහ ශාඛා සමිති වෙත ලැබීමට සලස්වනු ලැබේ. තව ද, එය ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ වෙබ් අඩවියෙන් ද බාගත කළ හැකි ය.

විධායක සභාවේ ධුරයන් සඳහා වූ නිලවරණය එදින ම බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේ දී පෙ.ව. 7 සිට 10 දක්වා පැවැත්වේ.

ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ සාමාජිකත්වය ලබා ගෙන නොමැති ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයෙකු, සංවත්සරික මහා සභාවට සහභාගී වීමට සහ නිලවරණයේ දී ඡන්දය ලබා දීමට අදහස් කරන්නේ නම්, 2023 ජූනි මස 19 වන දිනට පෙර ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ සාමාජිකත්වය SASA House වෙතින් ලබා ගත යුතු ය.

ඔබගේ සහභාගීත්වය පහත QR කේතය ඔස්සේ තහවුරු කිරීමට කටයුතු කරන්න..

SCAN ME

ස්තුතියි.

**ලීලනාත් වික්‍රම ආරච්චි**

ලේකම්

**23 සී, සමුළු නිවාස, කැප්පෙටිපොල මාවත, කොළඹ 05.** **23 சீ, சமிட் தொடர்மாடி,கெப்பிட்டிப்பொல மாவத்தை, கொழும்பு-05.**
**23C, Summit Flats, Keppetipola Mw., Colombo 05.**
**දුරකතනය/ தொலைபேசி/Telephone : 011 5766855** **ෆැක්ස්/தொலைநகல்/ Fax : 011 2058027**
**විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/ Email :** exco@sasa.lk **වෙබ් අඩවිය/இணையத்தளம்/ Web:** www.sasa.lk